# විශ්වසනීයත්වයෙහි පසුබිම

නවකතා වේවා වෙනත් සාහිත්‍යාංගයක් වේවා අවසාන වශයෙන් ගත්කල මිනිස් හැසිරීම් හා අන්තර්සම්බන්ධකම් පිළිබඳ ව වෙයි. යමකුගේ මනස අද ක්‍රියාකරන ආකාරය අධ්‍යයනය කිරීමෙන් ඒ තැනැත්තාගේ මනස හෙට ක්‍රියාකරන්නේ කෙසේ ද යන්න පිළිබඳව නිශ්චිත අනාවැකියක් පළකළ නො හැකි ය. කාවොන්ටම් අංශුවක යම් ගුණයක් මැනීමෙන් ලැබෙන අගය කුමක්දැයි කල්තබා කිවහැක්කේ යම් සම්භාවිතාවක් ඇසුරෙන් ය. මිනිස් මනස සම්බන්ධයෙන් අනාවැකියක් පළකිරීම එයට ද වඩා අසීරු ය.

සංකාරා චිත්‍රපටියෙහි භික්ෂුවගේ හැසිරීම කල්තබා කිව නොහැක්කේ ද ඒ කරුණ එලෙස නිශ්චිතව ගැනීමට නො හැකි බැවිනි. කොළඹ ප්‍රදේශයේ ජීවත් වූ පමණින්, විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයක් ලැබූ පමණින්, ඒ භික්ෂූන් වහන්සේ ඒ ඒ අවස්ථාවල ඒ ඒ පරිදි ක්‍රියාකළයුතු යැයි කිවහැකි නො වෙයි. අපට චරිතයක් විශ්වාසනීය ද නැත් ද යන්න පිළිබඳ ව විනිශ්චයක් දීම සඳහා නිර්ණායක නො මැත. අප කලින් ද සඳහන්කර ඇති පරිදි තරුණියන් දහස්ගණනක් දැක ඇති තරුණයකු එක් විශේෂ තරුණියක මුණගැසීමෙන් එතෙක් අත් නොදුටු ආකර්ෂණයක් අත්විඳිය හැකි ය.

සරච්චන්ද්‍ර මහතා සැබෑ ලෝකය හා සාහිත්‍යයෙහි කල්පනා ලෝකය ගැන කතාකෙළේ ය. ඒ මහතාට අනුව සාහිත්‍යයෙහි ඇත්තේ කාල්පනික ලෝකයකි. එහෙත් ඒ කාල්පනික ලෝකය සැබෑ ලෝකය බවට විශ්වාසයක් පාඨකයා තුළ ජනිතකළ යුතු ය. එවිට එය තාත්වික සාහිත්‍ය කෘතියක් වෙයි. එහෙත් ප්‍රශ්නය වන්නේ යම් කරුණක් පිළිබඳ විශ්වසනීයත්වයක් ඇතිකරගන්නේ කෙසේ ද යන්න ය. වෙනත් වචනවලින් කිවහොත් විශ්වාසනීයකත්වයක් ඇතිකරගැනීම සඳහා යොදාගත හැකි නිර්ණායක කවරේ ද යන්න අපේ ප්‍රශ්නය වෙයි.

කැලණිය විශ්වවද්‍යාලයෙහි සහකාර කථිකාචාර්යවරයකු වශයෙන් සේවය කළ භික්ෂූන් වහන්සේ නමක තරුණියක දැකීමෙන් පසු හැසිරිය යුත්තේ කෙසේ ද? ඒ කෙසේ විය යුතු දැයි කීම සඳහා ප්‍රවාදයක් නැත. බටහිර මනෝවිද්‍යාවෙන් හෝ මනෝවිශ්ලේෂණයෙන් හෝ ඒ සඳහා පිහිටක් නො ලැබෙයි. භික්ෂූන්වහන්සේ නමක නොව ඒ තැනැත්තා ගිහියකු වුව ද ඒ දැනගැනීමට ක්‍රමයක් නැත. අහසින් යන මිනිසුන් ගැන කියැවෙන කෘතියක් සාමාන්‍ය අර්ථයෙන් ගන්නේ නම් විශ්වාස නොකිරීමට අපි පෙළඹෙමු. එහෙත් අසාමාන්‍ය අර්ථයකින් එවැනි මිනිසුන් ගැන කියැවෙන කෘතියක් අප ප්‍රතික්ෂේපකරන්නේ කිනම් නිර්ණායක ඇසුරෙන් ද?

සරච්චන්ද්‍ර මහතාට එවැනි ප්‍රශ්නවලට පිළිතුරු තිබිණි යැයි නොසිතමි. පිළිතුරු තබා ඒ අර්ථයෙන් ගෙන ප්‍රශ්නය ඇසීමටවත් සුදුසු පසුබිමක් එකල නොතිබූ බව පැහැදිලි ය. සරච්චන්ද්‍ර මහතාගේ සැබෑ ලෝකය හා කාල්පනික ලෝකය පිළිබඳ ව ඊනියා යථාර්ථවාදීහු නම් ප්‍රශ්න කළහ. ඔවුන්ට විශ්වසනීයත්වය ම ප්‍රශ්නයක් විය. යමක් විශ්වාසනීය ද නැත් ද, යන්න තීරණයකරන්නේ පුද්ගලයෙකි. නවකතාවේ දී නම් පාඨකයෙකි. සිනමාවේ දී නම් ප්‍රේක්ෂකයෙකි. සාධාරණ වශයෙන් කිවහොත් නිරීක්ෂකයෙකි. සියළු නිරීක්ෂකයන් යම් කරුණක් සම්බන්ධයෙන් එය විශ්වාසනීය ය යන මතයට හෝ එයට පටහැණි මතයකට හෝ පැමිණිය හැකි ද?

යථාර්ථවාදීන්ට එවැනි ප්‍රශ්නවල දී පිහිටවන මූලික ප්‍රවාදයක් නැත. බටහිර භෞතික විද්‍යාඥයනට අහසින් යන චුම්බක ගැන සිතාගත හැකි ය. එහෙත් එසේ කළහැකි වන්නේ ඒ සඳහා අවශ්‍ය පසුබිම සැපයී ඇත්නම් පමණකි. චුම්බකය ඉහළට එසවීමට ක්‍රමවේදයක් ඇත්නම්, ඒ ක්‍රමවේදය බටහිර භෞතික විද්‍යාව සමග එකඟ විය යුතු වෙයි. චුම්බකය උඩට ගෙනයෑමට නම් ඒ සඳහා බලයක් යෙදවිය යුතු ය. එමෙන් ම චුම්බකය අහසේ පියාසරකරවීමට ද බල අවශ්‍ය වෙයි. ඒ බල ඇත්නම් බටහිර භෞතික විද්‍යාඥයනට අහසේ පියාසරකරන චුම්බක විශ්වාසනීය වෙයි.

එහෙත් බටහිර මනෝවිද්‍යාව යනු ඉතාමත් “ළදරු” විද්‍යාවකි. මනෝවිද්‍යාව ඇරඹී අවුරුදු සියයකට වැඩි වුව ද එහි වර්ධනයක් නැත. ඒ අතර මනෝවිශ්ලේෂණය හිතළු රාශියක් එළියට දමා ඇත. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් විද්වතාගේ සිට යක් ලකාන් විද්වතා දක්වා නොයෙකුත් ආකාරයේ මතිමතාන්තර ඉදිරිපත් කර ඇති නමුත් මනස යනු කුමක් දැයි තේරුම්ගැනීමේ හැකියාවක් ඔවුන්ට තිබෙන බවක් නො පෙනෙයි. ඊනියා මනෝවිශ්ලේෂණය හා මනෝවිද්‍යාව බොහෝ

© Prof. Nalin De Silva

බටහිරයන් විසින්වත් විද්‍යා ලෙස නො සැලකෙයි. ඒ මානවවිද්‍යා දැනුම් පද්ධතීන්හි විවිධ ගුරුකුලවල අය තම තමන්ගේ මත හැරෙන්නට බොහෝවිට අන් මතයක් නො පිළිගනිති.

ඊනියා මනෝවිද්‍යාව හා මනෝවිශ්ලේෂණය නිව්ටෝනීය සුසමාදර්ශයෙහි ක්‍රියාත්මක වන තුරු එහි වර්ධනයක් දක්නට නො ලැබෙනු ඇත. බටහිර ක්වොන්ටම් භෞතිකයට පවා නිව්ටෝනීය සුසමාදර්ශයෙන් ඔබ්බට යැමට සිදු වී ඇති කල ක්වොන්ටම් අංශුවලට වඩා සියුම් වූ මනස නිව්ටෝනීය සුසමාදර්ශයෙහි හැදෑරිය හැකි යැයි සිතීම ම විහිළුවකි. අහසින් යන මිනිසුන් ගැන ප්‍රවාද නිර්මාණයකිරීමට තබා මනස සිරුරෙන් පිටතට ගැනීමට හැකි ද නැත් ද යන ගැනවත්, මිනිසුන් නොවන සතුන්ට මනසක් ඇත් ද යන්න ගැනවත්, මේ ඊනියා මනෝවිද්‍යාඥයන්ට හා මනෝවිශ්ලේෂකයන්ට  කිව හැක්කේ හිතළු පමණකි. යමකුගේ මනස ඊනියා අනෙකකුගේ ආධාරයෙන් තේරුම්කරදීම ම කෙතරම් විහිළුවක් ද? ළදරුවන්ට මනස් ඇතිවන්නේ තමන්ගේ ප්‍රතිබිම්බය දර්පණ තලයක දැකීමෙන් පසුව යැයි කීමෙන් දර්පණ තල නිර්මාණයකිරීමට පෙර මිනිසුන්ට මනස් නොතිබූ බව ගම්‍ය වෙයි. එවැනි මිනිසුන් දර්පණ තල නිෂ්පාදනය කෙළේ කෙසේ ද යන්න ම ප්‍රශ්නයක් ලෙස මේ විහිළුකාරයන්ගෙන් ඇසිය හැකි ය. එහෙත් අප සාකච්ඡා කරමින් සිටින්නේ මේ විහිළුකරුවන් ගැන හෝ ඔවුන්ගේ විහිළු හෝ ගැන නො වෙයි.

යථාර්ථවාදීන් යැයි කියාගන්නවුනට සරච්චන්ද්‍ර මහතා දැක්වූ විශ්වසනීයත්වය යන්න වැදගත් නො වෙයි. ඔවුන්ට අවශ්‍යවන්නේ යමක් ඇත්තටම පවතින්නේ ද යන්නත් යම් සිදුවීමක් ඇත්තට ම සිදුවන්නේ ද යන්නත් දැනගැනීමට ය. එහෙත් ඒ ඊනියා ඇත්ත දැනගැනීමේ මාර්ගයක් බටහිර මනෝවිද්‍යාවෙන් හෝ බටහිර මනෝවිශ්ලේෂණයෙන් හෝ නොලැබීම ඔවුන්ට ප්‍රශ්නයක් වෙයි. ඔවුන් මාක්ස්වාදය අනුව ගොස් බොහෝ දෑ ආර්ථිකයෙන්  තේරුම්ගැනීමට යැමට එක් හේතුවක් වූයේ ද මේ ඊනියා ඇත්ත දැනගැනීමට ඔවුන්ට වෙනත් ක්‍රමයක් නො තිබීම ය. එහෙත් මාක්ස්වාදයෙන් ඔවුන්ට ලැබෙන පිහිටක් නැත. මනස ආර්ථිකයට ඌනනය කිරීම ගොරහැඩි ව්‍යාපෘතියක් පමණකි.

ගුණදාස අමරසේකර මහතා වැන්නවුන් සංකාරා චිත්‍රපටියෙහි භික්ෂුන්වහන්සේ එහි දැක්වෙන ආකාරයෙන් අව්‍යාජව හැසිරෙන්නේ ද නැත් ද යන්න තීරණය කරන්නේ කිනම් ප්‍රවාදයකට, නිර්ණායකයකට සාපේක්ෂව ද? එවැනි ප්‍රවාදයක් නැතිව ඔවුන්ට සිදුවන්නේ එකිනෙකාට දැනෙන ආකාරයට ඒ හැසිරීම ඇත්තක් ද බොරුවක් ද යන්න තීරණය කිරීමට ය. එය සරච්චන්ද්‍ර මහතා කියන විශ්වසනීයත්වයෙන් වෙනස් නො වෙයි. (මෙහි දී සරච්චන්ද්‍ර මහතා කියන යන ප්‍රකාශයෙන් ඒ මහතා එවැන්නක් තමාගේ ම වූ ප්‍රකාශයක් ලෙස කෙළේ යැයි වරදවා වටහාගත නො යුතු ය. ඒ මහතා ද අන් බොහෝ අය මෙන් ම කර ඇත්තේ බටහිර මතයක් පුනරුච්චාරණය කිරීම පමණකි.) අවසානයේ දී නවකතාවක හෝ චිත්‍රපටියක හෝ වෙනත් තැනක හෝ යම් චරිතයක් එසේ නිර්මාණය වී තිබීම ව්‍යාජ ද අව්‍යාජ ද යන්න තීරණයකිරීම ඒ ඒ විචාරකයාගේ මනසට සාපේක්ෂව සිදුවන්නක් බවට පත්වෙයි.

එහෙත් අපට මෙහි දී වඩා වැදගත්වන්නේ ඒ ඒ චරිතයෙහි අව්‍යාජත්වය හෝ ව්‍යාජත්වය හෝ ගැන විශ්ලේෂණය කිරීම නොව සංකාරා චිත්‍රපටියෙන් දෙන පණිවුඩය කුමක් දැයි දැනගැනීම ය. අප කලින් සඳහන්කර ඇති පරිදි කිසිම කලාකෘතියකින් පණිවුඩයක් නොදී සිටින්නේ නො වෙයි. බොහෝ දෙනා තේරුම් නොගත්තාට අක්ෂරය, සුළඟ එනු පිණිස, තනි තටුවෙන් පියෑඹීම වැනි චිත්‍රපටිවලින් අපට ලැබුණු පණිවුඩ විය. ඒ පණිවුඩවල දේශපාලනයක් තිබුණි. දේශපාලනයෙන් මුළුමනින් ම තොර කලාකෘතියක් නොව දාර්ශනික මතයක්වත් නැත. අප ඒ චිත්‍රපටිවලට විරුද්ධවන්නේ එහි ඇති පණිවුඩය හේතුකොටගෙන ය. ඒ පණිවුඩය බටහිරයන්ට අවශ්‍ය පණිවුඩයක් වෙයි.

කලාකෘතිවලින් මේ පණිවුඩ ලැබෙන්නේ සාධාරණීකරණය ඔස්සේ ය. බටහිර විද්‍යාවත් නිව්ටෝනීය සුසමාදර්ශයත් ගුරුකොටගන්නා බටහිර ඊනියා යථාර්ථවාදී කලාකරුවෝ කලාකෘතිවලින් සාධාරණ (පොදු යන අර්ථයෙන් - general) චරිත නිරූපණය කරති. එයටත් වඩා බටහිර විචාරකයෝ හා සාමාන්‍ය ජනයා ඒ කලාකෘති කියවන්නේ හෝ නරඹන්නේ හෝ අසන්නේ හෝ මේ සාධාරණ නිරූපණය ඔස්සේ ය. එයට හේතුව බටහිර ලෝකය නිව්ටෝනීය සුසමාදර්ශයෙහි කටයුතු කිරීම ය. අද ඒ සුසමාදර්ශය මුළු මහත් බටහිර ලෝකයෙහි ද අනෙක් රටවල ඊනියා උගතුන්, එනම් බටහිර මතිමතාන්තරවල  සිරකරුවන් කෙරෙහි ද තම ආධිපත්‍යය පතුරා ඇත.

© Prof. Nalin De Silva

කලාකෘතියෙන් නිරූපණයවන්නේ කවරක් ද කුමක් ද, යන්න නිව්ටෝනීය සුසමාදර්ශයෙහි කටයුතු කරන්නන්ගේ සිත්වල අවිඥානික ව හෝ පවතියි. සංකාරා චිත්‍රපටියෙහි නිරූපණයවන්නේ විශේෂිත වූ භික්ෂූන්වහන්සේ නමකගේ චරිතය නොව සාධාරණ සිංහල භික්ෂූන්වහන්සේ නමකගේ චරිතය යැයි මේ අය සිතති. මේ සාධාරණීකරණය  ඊනියා විචාරවල දකින්නට ඇත. ගුණදාස අමරසේකර මහතා නගන අව්‍යාජ චරිත පිළිබඳ ප්‍රශ්නයේ ද පසුබිම ඇත්තේ ඒ සාධාරණීකරණයෙහි ය. ඒ ඒ චරිතවලට පුද්ගලික වූ හැසිරීමක් ඇතැයි පිළිගැනෙන්නේ නම් හා මනසෙහි ක්‍රියාකාරීත්වය කල්ඇතිව පුරෝකථනය කළහැකි යැයි උපකල්පනය නොකරන්නේ නම් ව්‍යාජත්වය පිළිබඳ එතරම් දරදඬු ආකාරයකින්  නිගමනවලට පැමිණීමේ අවශ්‍යතාව පැන නොනගී.

එහෙත් මේ සියල්ලෙන් කියැවෙන්නේ යම් ජනකොටසක පොදු ගුණාංග නැති බව නො වෙයි. ඒ ඒ පුද්ගලයා හැසිරෙන්නේ තම තමන්ට වූ සුවිශේෂ ආකාරයකින් ය යන්නෙන් යම් ජාතියක් ජනවර්ගයක් ආදී වශයෙන් මිනිසුන් කටයුතු නොකරන්නේ යැයි නිගමනය කළයුතු නො වෙයි. ඇතැම් ඊනියා පශ්චාත්නූතනවාදීන් එවැනි නිගමනවලට එළඹෙන බව පැහැදිලි ය. නූතනත්වයට හිමි වෙන්කිරීම හුදු තර්කානුකූල අන්තයකට ගෙනයෑමක් මෙහි දී සිදුවෙයි. යම් ජාතියකට, ජනවර්ගයකට හිමි පොදු සංස්කෘතියක් ඇත. එහෙත් ඉන් අදහස්කරන්නේ ඒ ජාතියේ හෝ ජනවර්ගයේ හෝ සියල්ලන් ම එකම ආකාරයකට කටයුතු කරන බව නො වේ. ඒ ඒ මිනිසා තම තමාගේ ලෝකය, එනම් දැනුම් පද්ධතිය, නිර්මාණයකරගනියි. ඒ ඒ තැනැත්තා එලෙස කරන්නේ තම සංස්කෘතියට, ඉන්ද්‍රිය පද්ධතියට හා මනසට සාපේක්ෂව ය. ඕනෑම ජනකොටසක, ඕනෑම සාමාජිකයකුට ඒ ජනකොටසට හිමි ගුණ පොදුවේ ඇති අතර තම තමාගේ සුවිශේෂ ගුණ ද වෙයි. සංඝ සමාජයට ද ඒ එලෙසම ක්‍රියාත්මක වෙයි. එහෙත් සාධාරණීකරණය ගැන පමණක් උනන්දුවන බටහිර නිව්ටෝනීය සුසමාදර්ශයේ උගත්තු හා අනෙක් රටවල සිටින ඔවුන්ගේ අනුකාරකයෝ සුවිශේෂත්වය නැතිව පොදු බව පමණක් ගැන අවධාරණය කරති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva